# දෙගල්දොරුව රාජමහා විහාරයේ රාජකාරි ක්‍රමය



වයි. කේ. තිස්ස බණ්ඩාර

ශ්‍රී ලංකාවේ මධ්‍යම පළාතේ මහනුවර පාතදුම්බර අමුණුගම හා සිරිමල්වත්ත යන ග්‍රාමයන් ආශ්‍රිතව දොගල්දොරුව රජමහා විහාරය පිහිටා තිබේ. ඓතිහාසික වශයෙන් ප්‍රසිද්ධියට පත් මේ විහාරස්ථානයේ පුරාණ රාජකාරි ක්‍රමය පිළිබඳ අවධානය යොමු කිරීම මේ ලිපියෙහි අරමුණ වේ. ශ්‍රී දළදා මාලිගයත් ඇතැම් රාජමහා විහාරවලත් රජමාලිගාව, සතර දේවාලය සහ පිටිසරබද ඇතැම් දේවාල සඳහාත් රාජකාරි පංගු ක්‍රමයක් පුරාණයේ දී ක්‍රියාත්මකව තිබේ. රාජකාරි ක්‍රමය පිළිබඳව පී.ඇම්. අභයසිංහ මහත්මා සිය උඩරට විත්ති කෘතියේ සඳහන් කරන ආකාරයට රජයට කරන සේවය රාජකාරිය යි. රාජමන්දිරය දළදා මාලිගාව, සතර දේවාලය, රාජමහා විහාරය යන මේ ආයතන වැඩවසම් ක්‍රමය අනුව රාජකාරියට පත් කර තිබේ. මේ ස්ථානයන්හි ප්‍රධාන නිලධාරීන්ට ඇතුළු කට්ටලයේ නිලධාරීන් යයි ද සුළු සේවකයින්ට නිලකාරයින් යයි ද ව්‍යවහාර කරන ලදී. මේ දෙපක්ෂය විසින් ම රාජමන්දිරය, දළදා මාලිගය, සතර දේවාලය යන ආයතනයන වල ඒ ඒ අයට නියමිත රාජකාරිය කළයුතු වන්නේය. මේ සේවය රාජකාරිය නමින් හඳුන්වනු ලැබේ. ඒ ඒ නිලධාරීන් විසින් භුක්ති විඳිනු ලබන ඉඩම් කොටස්වලට නිල පංගුයයි නම් කෙරිණ. යට දැක්වූ ආයතනයවල සේවය සංවිධානය කරන්නේ අගමැති හෙවත් අදිකාරම් විසින් තෝරා රජු විසින් පත් කරනු ලද බස්නායකවරුන් විසිනි.

ඉහත දක්වන ලද ස්ථානවලට අමතරව පිටිසරබද පුරාණ දේවාල සඳහා ද නිල පංගු ප්‍රදානය කර තිබේ. ඇම්බැක්කේ



දේවාලය, දොඩංවල නාථ දේවාලය, අලවතුගොඩ සමන් දේවාලය, හපුගොඩ පිටියේ දේවාලය යනු ඉන් කිහිපයක් පමණි.

රාජකාරි ක්‍රමය පිළිබඳ විවිධ අර්ථකතන සහ අදහස් තිබිය හැකිය. පොදුවේ බලන කළ මින් අදහස් වනුයේ ඉහත සඳහන් ස්ථාන හෝ එබඳු තවත් තැන් සඳහා කෙරෙන්නා වූ සේවයක් වෙනුවෙන් එම ආයතනයෙන් ගෙවනු ලැබූ දීමනාවකි. එය දේපල සහ මිල මුදල් යන දෙයාකාරයෙන් ම සිදුව තිබේ. විශේෂයෙන් ම ඉඩම් දේපල මේ වෙනුවෙන් දී තිබීම ප්‍රසිද්ධ කරුණකි. පරපුරින් පරපුරට උරුම වන රාජකාරි ක්‍රම ද කාලයෙන් කාලයට මාරු වන (අවසන් වන) රාජකාරි නිල ක්‍රමය ද මේ අතර විය. අදාළ ස්ථානයේ පැවැත්ම, නඩත්තුව, ක්‍රියාකාරීත්වය අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා නිත්‍ය සේවා ක්‍රමයක් මෙයින් බලාපොරොත්තු වූවා විය හැකිය. වැඩවසම් ක්‍රමයක් මේ ආශ්‍රයෙන් ගම්‍ය වන්නේදැයි තව ද සිතා බැලිය යුතුය. ඒ ඒ ස්ථාන වෙනුවෙන් ගෞරව භක්තියෙන් යුතුව සිදුකරනු ලබන සේවාවක් බව මේ රාජකාරි සේවය ඇගයීම යුක්ති සහගත වේ. සුවිශේෂ හැකියාවන් ඇති අයවලුන් තෝරා ඒ ඒ හැකියාවේ සේවයට දෙනු ලැබ ඇති දීමනා රාජකාරි දීමනා ලෙස සැලකිය හැකිය. මේවා පිළිබඳව අදාළ උගතුන් අතරේ විවිධ අදහස් ඇති බව පිළිගනිමු. දැනට ඇති වාර්තා අනුව ශ්‍රී දළදා මාලිගය හා සම්බන්ධ රාජකාරි ක්‍රමය සඳහා තොරතුරු බහුලය.

දෙගල්දොරුව රාජමහා විහාරය ආශ්‍රයෙන් විවිධ ශාස්ත්‍රීය කටයුතු සඳහා සොයනු ලබන හා දැනගනු රිසි කැමැත්ත මතු දැක්වෙන කරුණු කෙරෙහි අවධානය යොමු කරනු මැනවි.

| | |
|---|---|
| මුර පංගුව :- | ලැබූ අය |
| | කන්නන්ගර ගෙදර අප්පුහාමි |
| | තෙන්නකෝන් ගෙදර අප්පු |
| | තෙන්නකොන් ගෙදර රන්මැණිකා |
| | කන්නන්ගර ගෙදර ඩිංගිරි අම්මා |
| ගම :- | පිලවල |
| ලැබූ දේපල :- | ගණේකුඹුර (පෑල් 02) |
| | ගණේකුඹුර (පෑල් 01) |
| | ගණේකුඹුර (පෑල් 01) |
| | ගණේකුඹුර (පෑල් 01 ) |
| | එම වනාත (කාර්තු 03) |
| | එම (කාර්තු 02) |

### රාජකාරියේ ස්වරූපය

එක මුරයට දවස් පහළොව බැගින් මුර දොළහක දී උදේ තේවාවටත් සවස තේවාවටත් මල් වට්ටියක් බැගින් කඩාගෙනත් දීමටත් රෑ මුරේ සිටීම ද මලුව උදලු ගෑම ද මංගල්‍ය සතරට වැඩරාජකාරි කළ විට විහාරයට පැමිණ භාරකාර සංඝයා නම විසින් නියම කරන සිරිත වූ ඌළියන් වැඩ කිරීමට ද දවස් පතා උදයට කැඳත් පෝය දවස්වල හා මංගල්‍ය දවස්වල මහදානේ වේලාවට බත්මාලු වේලකුත් ලැබීම ද සංඝයා නම ගමනක් යන විට මුර නොසිටින කොයියම් පංගුකාරයෙක් නමුත් කැටුව යාම ද එලෙස ගමන් ගන්නා විට සංඝයා නමගෙන් දවසකට බත් මාලුත් වේලක් බැගින් ලැබීම ද අලුත් අවුරුදු මංගල්‍ය පසුවූ කඩිනමින් කැවිලි පෙනුම් හතරකුත් බුලත් අත් හතරකුත් දීම ය.

මුර පංගුව :- ලැබූ අය
දහනැක්ගෙදර කිරිහාමි
ගම :- නාපාන
ලැබූ දේපල :- දහනැක් ගෙදරකුඹුර (පැල් 02)
මෙගොඩවත්ත (පැල් 02)
එගොඩවත්ත (කාර්තු 08)

### රාජකාරියේ ස්වරූපය

මාසයක් ඇර මාසයක් දවස් පහළොහේ මුරයක් බැගින් මුර හයක් රෑට විහාරේ මුරට සිටීම ද, විහාරේ ගෘහස්ථ වැඩපල කිරීමේ දී මහාදානයෙන් පසු විහාරෙන් පිටට ගොස් ඊම ද ප්‍රධාන රාජකාරිය වන මහදානේට පසුව මල් වට්ටියකුත් සවස් තේවාවට පසුව මල් වට්ටියකුත් විහාරේ වත්තෙන් කඩාදීමට ද විහාරේ මලුව උදලු ගෑම ද සහ ඒක සුද්ධ පවිත්‍රව තබාගැනීමය. රාජකාරි කරන්නාට උදයට කැඳ ලැබේ. අලුත් අවුරුදු මංගල්‍ය පසුවූ කඩිනමින් භාරකාර සංඝයා නමට පෙනුම් පිණිස කැවිලි පෙට්ටියකුත් බුලත් හතළිහකුත් දීම ය. වැඩවලට අවුරුදු පතා ගෙවන මුදල රුපියල් 08 ශත 80යි.



සුදු හකුරු දෙන පංගුව :- ලැබූ අය
උපාසක දූරයලාගේ හවඩියා
ගම :- දෙගල්දොරුව
ලැබූ දේපල :- මත් අඹේ අස්වැද්දුම කුඹුර (කාර්තු 08)
එම ඉඩම (පැල් 01)

### රාජකාරියේ ස්වරූපය

එකිනෙක මාසය අන්තිම වෙන්නට ප්‍රථම රාත්තල් භාගයක් බර කැටයක් බැගින් සුදු හකුරු කැට හතරක් මාස්පතා දීමට ද, අවුරුද්දට දෙවරක් පන්සලේ ගොම ගෑම ද සතර මංගල්‍ය දවස්වල නියම කරන්නට යෙදෙන ඌළියම් වැඩ කිරීම ද ඒ වැඩ කරන විට කෑමට මහදානේ වේලාවට බත් මාලුත් ලැබීම ද ය. අවුරුද්දට ගෙවන මුදල, රුපියල් 02 ශත 50 යි.

හකුරු දෙන පංගුව :- ලැබූ අය
දවුල්කාරගෙදර කිරිහටනා
ගම :- කපුලියද්ද
ලැබූ දේපල :- කපුලියද්ද කුඹුර (අක්කර 01)
එම වනාත (කාර්තු 05)

### රාජකාරියේ ස්වරූපය

අවුරුද්දකට හකුරු කැට එක්දහස් අසූවක් දීම ය. අවුරුද්දකට ගෙවන මුදල රුපියල් 18 ශත 80 යි.

හේවිසි පංගුව :- ලැබූ අය
පනික්කියලැගෙදර ඩිංගිරා පනික්කියා
ගම :- කපුලියද්ද
ලැබූ දේපල :- කපුලියද්ද කුඹුර (පැල් 02)
එම වනාත (කාර්තු 05)

### රාජකාරියේ ස්වරූපය

එකවරකට පහළොස් දවස බැගින් අවුරුද්දට තුන් මාසයක් විහාරේ මුර සිටිමින් හන්දෑදුරේත් හේවිසි ගැසීම ද් මංගල්‍ය සතරේ දී දවුල් ගැසීම ද ප්‍රදාන ප්‍රස්තාවල දී අනිකුත් නිලකාරයන් සමඟ සංඝයා නමගේ ගමන්වල දී දවුල ගහමින් කැටුව යාම.

ගෙවන මුදල :- 9.40
හේවිසි පංගුව :- ලැබූ අය
අමුණුගමගෙදරඩිංගිරා දවුල්කාරයා
තම්මැට්ටයලාගේ ගෙදර කිරිබෙයා
ගම :- ඌරදෙණිය
ලැබූ දේපල :- ඌරදෙණියේ කුඹුර (පැල් 01)
(කාර්තු 05) එම වත්ත (පැල් 01)

## රාජකාරියේ ස්වරූපය

මාසයක් ඇර මාසයක් එක මුරයකට දවස් පහළොව බැගින් මුර 6ක් මිනිහෙක් විසින් තේවාව තුනට හේවිසි ගැසීම ද රැට විහාරේ මුර සිටීම ද මංගල්‍යයේ සතර හේවිසි ගැසීම ද වැඩ රාජකාරි කරන විට උදයට කැඳ විහාරෙන් ලැබීම ද මුරේ සිටින විට පැමිණෙන පෝය දවස්වල උදය කැඳත් දවාලට බත් මාලුත් ලැබීම ද භාරකාර සංඝයා නම ගමන් යන විටක කැටුව යාමට ද මිනිහෙක් ඕනෑ කළ විටක පංගුවෙන් මිනිහෙක් දීම ද සංඝයා නම විසින් ඔහුට උදයට කැඳත් දවාලට සහ සවසට බත් මාලුත් දීම ද මුරේ සිටින විට මුරකරන්නා විසින් විහාරේ මලුව උදලු ගෑම ද අලුත් අවුරුදු මංගල්‍ය පසුවූ කඨිනමින් එක පෙනුමට බුලත් හතළිහක් බැගින් පෙනුම් දෙකක් භාරකාර සංඝයා නමට දීම ය.

වැඩ වෙනුවට අවුරුදු පතා ගෙවන මුදල රු 14. 10

පනික්කි පංගුව :- මාරුවෙනවාය
ගම :- කපුලියද්ද
ලබන දේපල :- කපුලියද්ද කුඹුර (පැල් 02)
එම වනාත (කාර්තු 05)

## ආශ්‍රිත ග්‍රන්ථ

Lawrie, A.C. 1896. *A gazetteer of the central of Ceylon,* Colombo.

*Service tenures register Kandy.* 1872 (රාජ්‍ය ලේඛනාගාරයේ මහනුවර ශාඛාවේ අප්‍රකාශිත වෙළුම)